# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2240/36 - 2021 අගෝස්තු මස 13 වැනි සිකුරාදා - 2021.08.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

### පෙත්සම පිළිබඳ දැන්වීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 32 සහ 37 දරන වගන්ති සමග කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (පීබී 123) ගණන් බේරා වසා දැමීම

ඉහත නම් දරන සමාගම කොළඹ වාණිජ මහාධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් 2020 ඔක්තෝබර් මස 07 වන දින, කොළඹ 01 පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජයකොඩි ආරච්චිගේ දොන් සමන් ජයනාත් නානායක්කාර යන අය විසින් එකී අධිකරණයට ඉදිරිපත් කරන ලද බව ද, ඉහත කී පෙත්සම 2021 ඔක්තෝබර් මස 11 වන දින අධිකරණය ඉදිරියේ විභාගයට ගනු ලැබීමට නියම කර ඇති බවද, සහ එකී පෙත්සම මත ආඥාවක් කරනු ලැබීම තහවුරු කිරීමට හෝ ඊට එරෙහි වීමට හෝ උත්සුක වන ඉහත කී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට එකී කාර්යය සඳහා නඩු විභාගයේදී තමාම හෝ ඒ තැනැත්තාගේ නීතිඥවරයා මගින් පෙනී සිටීමට හැකි බව ද, පෙත්සමේ පිටපතක් එය අවශ්‍ය කරන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන යොද ඇති තැනැත්තා විසින් නියම කරන ලද ගාස්තුව ගෙවීම මත සපයනු ඇති බව ද මෙයින් දන්වනු ලැබේ.

අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ
දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 01.

*සටහන* : එකී පෙත්සම විභාගයේ දී පෙනී සිටීමට අදහස් කරන ඕනෑම තැනැත්තකු ඔහුගේ එකී අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් ඉහත සඳහන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත භාර දීම හෝ තැපෑලෙන් යැවීම කළ යුතුය. දැන්වීමෙහි, තැනැත්තාගේ නම සහ ලිපිනය හෝ ආයතනයක් නම් ආයතනයෙහි නම සහ ලිපිනය සඳහන් කළ යුතු අතර, තැනැත්තා විසින් හෝ ආයතනය විසින් හෝ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නීතිඥවරයා (සිටී නම්) විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු අතර, භාර දීම හෝ තැපෑලෙන් යැවීම ඉහත නම් දරන අය වෙත ළඟා වීමට ප්‍රමාණවත් කාලයක් සහිතව සහ 2021 ඔක්තෝබර් 9 වන දින පස්වරු 1.00 පසු වීමට පෙර ලැබෙන පරිදි කළ යුත්තේ ය.

08 - 301


1A - G 34828 — 40 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*